# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2321/63 - 2023 මාර්තු මස 02 වැනි බ්‍රහස්පතින්දා - 2023.03.02**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : තිප්‍රාලේ/1/8/3/60 අත්.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය*: 4-3/6/2016/HW/322.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:*

බේස්ලයින් මාර්ගය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය - අදියර III සඳහා ඉඩම් අත්කර ගැනීම

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ (නැගෙනහිර පාමංකඩ, කොළඹ මහ නගර සභා සීමාව තුළ) කිරුලපන ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක මු.පි.කො. 10009 හා 2022.09.13 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 1 වශයෙන් පෙන්නුම් කර ඇති හෙක්ටයාර් 0.0175 ක් පමණ වූ ඉඩම් කැබැල්ලේ විස්තර පහත පරිදි වේ:

01. කැබලි අංක 1

ඉඩමේ නම: වරිපනම් අංක 10 (කොටසක්) බලපොකුණ පුරාණ විහාර පාර; වර්තමාන ඉඩම් පරිහරණය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් ඇත; හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය: දයානන්ද හේවාකුරුප්පු කන්දෙදොල තේ කම්හල, පිටබැද්දර; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0175.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2023 අප්‍රේල් මස 24 වැනි දින පෙ.ව. 10.00 ට තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තව ද, 2023 අප්‍රේල් මස 10 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

**ප්‍රියන්තා දිසානායක,**
ප්‍රාදේශීය ලේකම්,
තිඹිරිගස්යාය.

2023 පෙබරවාරි මස 24 වැනි දින,
තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 03 - 00012